Set A 3

# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

**පළමු වාර පරීක්ෂණය 2018** — **11 ශ්‍රේණිය**
**இரண்டாம் தவணைப் பரீட்சை 2018** — **தரம் 11**
**First Term Test 2018** — **Grade 11**

**සිංහල භාෂාව හා සාහිත්‍යය III**
**சிங்களமொழியும் இலக்கியமும் III**

**පැය දෙකයි**
**மூன்று மணித்தியாலம்**

**1.** (i) සිට (x) තෙක් සියලු ම අනු කොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නො ලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) (අ) ''අමාවතුර'' කෘතියෙහි රචකයාගේ නම ලියන්න.
(ආ) ''අමාවතුර'' කෘතිය සඳහා මුල් කරගත් බුදුගුණය කුමක්ද?

(ii) ''මම එබස් අසා රජකු බොළඳ නියා යයි නින්දා කළෙමි' යි'' කීය.
(අ) මෙය කිනම් අවස්ථාවකදී ප්‍රකාශ කරන ලද්දක් ද?
(ආ) මෙම ප්‍රකාශය ශ්‍රවණය කළ තැනැත්තාගේ නම ලියන්න?

(iii) (අ) හංස සන්දේශය ලියැවුනේ කිනම් යුගයකදීද?
(ආ) එම යුගයෙහි ලියවුණු තවත් සන්දේශයක නම ලියන්න.

(iv) ''මිනිසුන් ඉවුරුවල යන එන අඩි සද්දෙන්
ළය යට සසල බව මින් මතු නොනැගෙද්දෙන්''
(අ) මෙහි ඉතිරි පද දෙක ලියා දක්වන්න.
(ආ) මෙම කවි පෙළෙහි රචකයා නම් කරන්න?

(v) (අ) සද්ධර්මරත්නාවලිය සඳහා මූලාශ්‍ර වූ ග්‍රන්ථය කුමක්ද?
(ආ) උග්ගසේන නම් සිටුපුත්හුගේ වස්තුව එහි එන කීවෙනි කතා වස්තුව ද?

(vi) (අ) බැද්දේගම කෘතියෙහි පරිවර්තකයාගේ නම ලියන්න.
(ආ) 'වනසරණ' නම් කෘතියට පාදක කරගත් මුල් කෘතියෙහි නම කුමක්ද?

(vii) (අ) ''රාජ කුමරියෝ පළඳති රන් මිණිබරණා'' මෙය කාගේ ප්‍රකාශයක් ද?
(ආ) ''සිංහබාහු'' නාට්‍ය රචකයා ලියූ නවකතා දෙකක නම් ලියන්න.

(viii) ''තොප ම කොට ඇවිදිනා කටයුතු හෙයින් තොප ම අරහයා කියමි''
(අ) මෙය කාගේ ප්‍රකාශයක්ද?
(ආ) ඉහත පාඨය උපුටාගත් මුල් ග්‍රන්ථය කුමක් ද ?

(ix) (අ) එස්.මහින්ද හිමියන් විසින් රචිත ළමා කාව්‍යය නිර්මාණ දෙකක් නම් කරන්න.
(ආ) මහින්ද හිමියන් මුලින් ම පැවිදි වූයේ කිනම් නිකායකද?

(x) (අ) සංයුක්ත නිකායට්ඨ කතාව හැඳින්වෙන වෙනත් නමක් ලියන්න?
(ආ) 'හානා හීයපානා අඬහැරෙන් දැනේ' පැදිපෙළ අයත් වන්නේ කිනම් කාව්‍ය ගණයකට ද?.

(ලකුණු 2 × 10 =20යි)

2. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

i. ''කොළ වහා මේ නුවර ඒ ඒ දිගින් අගල මැඩ හස්වා පවුරු දොරටු අටලු වාසල් බලකොටු ආදිය බිඳ, සුනු විසුනු කෙරෙමින් වහා නුවරට වැද, ගැල් පුරා ගෙනවුත් කොමඩු බානා සේ මහා ජනයාගේ හිස් කපා ගනුව''

අ) මේ පාඨයෙහි ඇතුළත් උපමාවක් ලියන්න.

අ) ඉහත පාඨය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

ii. ජාතිය රන් විමනක් වේ
ආගම මිණි පහනක් වේ
ඔය රැකගන්නට මෙ ලොවේ
සමත් වෙතොත් පුත නුඹ වේ

අ) මෙම කවියෙහි අතුළත් රූපක දෙකක් ලියන්න

ආ) කවියේ අර්ථය ලිහිල් බසින් ලියන්න

iii. ''සිටුපුත් **යාළණු** කෙනෙකුන් හා සමග මැස්සක් මත්තේ සිට ආස සිට නටන ඒ විද්දත් දුවගේ **භාවභාව** ලීලා දැක...''

අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න..

ආ) මෙම පාඨයෙහි අර්ථය ලිහිල් බසින් ලියන්න.

iv. අඳුරු කරුවලේ පඳුරට මුවා වෙලා
විදුලි එළිය දැක ගිනි හුළ දියේ හෙලා
අනුන් ලියන් දැක තම ලියට තල තලා
දුවන මුවන් දැක නොදමන් නෙළුව පලා

අ) මෙම කවියෙන් උපුටා ගත හැකි ප්‍රස්තාව පිරුළක් උපුටා දක්වන්න?

ආ) සමස්ත කවියෙහි අර්ථය කෙටියෙන් පහදන්න.

v. '' වහන්සෙ සැවැත් නුවර කෙනෙසි අහර සිඟිනුයෙම් මූඪගර්භ මාගමක දිටිමි''

අ) ඉහත පාඨයෙහි අදහස සරළ බසින් ලියන්න.

ආ) මෙම පාඨය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් දක්වන්න.

(ලකුණු 4×5= 20යි)

3. i. සිලිඳුගේ චරිතයත්,

ii. පුංචිමැණිකාගේ චරිතයත්,

බැද්දේගම නවකතාව තුළ නිරූපනය කර ඇති ආකාරය නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පහදන්න.

(ලකුණු 15යි)

නැතහොත්,

i. අයහපත් අදූරදර්ශී ගුරුවරයෙකු නිසාවෙන් පුද්ගලයකු විනාශ වන ආකාරයත්

ii. යහපත් දූරදර්ශී ගුරුවරයෙකුගේ ක්‍රියාකලාපයන් මගින් පුද්ගලයෙකුට සෙත සැළසෙන ආකාරයත් .

අඟල්මල් දමනය කතාව ඇසුරෙන් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පහදන්න.

(ලකුණු 15යි)

4. i. වර්තමාන සරල බසත්,
ii. කාව්‍යමය වියත් බසත්,

උපයෝගී කර ගැනීම ගුත්තිල කාව්‍යයෙහි සාර්ථකත්වයට හේතුවී ඇත. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පහදන්න.

(ලකුණු 15යි)

නැතහොත්,

i. සරල උපමා ඇසුරෙන් උපදේශයන් ලබා දීමත්,
ii. ගැමි බස් වහර උපයෝගී කරගැනීමත් ,

නිසාවෙන් හානා හීය පානා අඬහැරෙන් දැනේ පද්‍ය පන්තිය සාර්ථක වී ඇත. එක් කරුණකට උදාහරණ දෙක බැගින් ඉහත ප්‍රකාශය සනාථ කරන්න.

(ලකුණු 15යි)

- 5,6,7 ප්‍රශ්නවලින් එකකට පමණක් උත්තර ලියන්න.

5. කැරගල වැනුම මගින් පැරණි ගම්මානයක තොරතුරු තත්ත්වාකාරයෙන් ගෙනෙන්නට කතුවරයා සමත්වී ඇති ආකාරය නිර්දිෂ්ට කොටසින් උදාහරණ තුනක් ගෙනහැර දක්වමින් විමසන්න

(ලකුණු 10යි)

6. සිංහබාහු නාට්‍යයය අඩසියවසක් මුළුල්ලේ ඉහළ ප්‍රේක්ෂක ප්‍රතිචාරයන් ලබා ගැනීමට හේතු වී ඇත්තේ එහි පවත්නා උසස් නාට්‍ය රසය නිසාවෙනි. උදාහරණ තුනක් ඇසුරෙන් පහදන්න.

(ලකුණු 10යි)

7. 'ගංගාවේ සංගීතය පැදි පෙළ රචනයේ දී පරිසරයේ සජීවී බව මැනවින් නිරූපණය කිරීමට උචිත පරිදී භාෂාව භාවිත කිරීමට සමත් ව ඇත. උදාහරණ තුනක්වත් ඇසුරෙන් විමසන්න.

(ලකුණු 10යි)